**රජ්ගම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
--------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු 03 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අගෝස්තු 18 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට රජ්ගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 උසස් ගිණුම්කරණ පරිචයන්

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ප්‍රධාන ලෙජරයෙහි වත්කම් හා වගකීම් ශේෂ සටහන් කිරීම සඳහා ජර්නල් සටහන් භාවිතා කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මිළදී ගන්නා ලද රු.1,099,228 ක ලිපිද්‍රව්‍ය (පොදු ගබඩා) රු.2,651,560 ක විදුලි තොග හා රු.151,780 ක ආයුර්වේද තොග වටිනාකම් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුමට බැර කිරීම නිසා එම ගිණුමේ ශේෂය රු.3,902,568 කින් වැඩියෙන් දැක්විණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලෙජරයට අනුව සමුච්චිත අරමුදල් හා ඌනතා ගිණුමේ ශේෂය රු.32,258,192 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.30,204,036 ක් ලෙස දැක්වීම නිසා රු.2,054,156 ක් අඩුවෙන් දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිළදී ගන්නා ලද රු.424,236 ක් වූ ලී බඩු හා සවිකිරීම් හා රු.294,500 ක් වූ මෝටර් රථ හා කරත්ත ප්‍රාග්ධනිත කර නොතිබුණි

(ඈ) ස්වයංක්‍රීය අළුත් කිරීමේ ස්ථාවර තැන්පතු 04 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොලී ගණනය කර ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය තොගය රු.20,295 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.32,087 ක් ලෙස දැක්වීම නිසා රු.11,792 ක් වැඩියෙන් දැක්විණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර හා ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් රු.4,605,740 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම නිසා වර්ෂයේ ප්‍රාග්ධන ආධාර හා ණයගැතියන් සහ ප්‍රාග්ධන වියදම් හා ණයහිමියන් එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දැක්විණි.

(උ) සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය ගිණුමෙන් කර්මාන්ත ගිණුමට කරන ලද මුදල් මාරු රු.500,000 ක් ප්‍රාග්ධන ආධාර ලැබීම් ලෙස සටහන් කිරීම නිසා වර්ෂයේ ප්‍රාග්ධන ආධාර රු.500,000 කින් වැඩියෙන් දැක්විණි.

(ඌ) ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබී තිබූ ප්‍රාග්ධන ආධාර රු.12,147,073 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ලැබීම් ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන ආධාර හා ණයගැතියන් රු.12,147,073 බැගින් වැඩියෙන් දැක්විණි.

(එ) ඉකුත් වර්ෂවල කර්මාන්ත ණයහිමියෝ ලෙස ප්‍රතිපාදනය කර තිබූ කර්මාන්ත 28 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී කරන ලද ගෙවීම් රු.7,064,706 ක් වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙස සටහන් කිරීම නිසා ප්‍රාග්ධන වියදම් හා ණයහිමියන් රු.7,064,706 බැගින් වැඩියෙන් දැක්විණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ගිණුමෙන් සාමාන්‍ය ගිණුමට කරන ලද මුදල් මාරු රු.4,317,134 ක් ප්‍රාග්ධන වියදම් ලෙස සටහන් වීම නිසා ප්‍රාග්ධන වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණි.

(ඔ) ඉකුත් වර්ෂවල රැඳවුම් මුදල් නිදහස් කිරීම් රු.707,994 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙස සටහන්වීම නිසා ප්‍රාග්ධන වියදම් හා තැන්පතු රු707,994 බැගින් වැඩියෙන් දැක්විණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.4,308,480 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.7,800,000 ක් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ ආදායම සහ ණයගැතියන් රු.3,491,520 බැගින් වැඩියෙන් දැක්විණි.

**1.3.4 නොසැසඳූ පාලන ගිණුම්**

**--------------------------**

ගිණුම් විෂයයන් 05 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.8,351,597 ක වෙනසක් පැවතුණි.

### 1.3.5 අවිනිශ්චිත ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.636,821 ක් වූ අවිනිශ්චිත ගිණුම් හර ශේෂය හඳුනාගෙන ගිණුම් ගැලපීම් කර නොතිබුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.41,354,659 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා, ස්ථාවර තැන්පතු සහතික, විධිමත්ව පවත්වාගෙන යනු ලබන ණයහිමි ලේඛනය සහ ශේෂ සනාථ සහතික පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

### 1.3.7 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්

------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඔ) වගන්තියේ විධිවිධාන අනුව මහජන විනෝද කටයුතු හෝ විනෝදාංශ වෙනුවෙන් හෝ යම් පුස්තකාල හෝ යම් අධ්‍යාපනික, විද්‍යාත්මක, පුණ්‍ය හෝ සුභසාධක ආයතනවලට ආධාර පිණිස හෝ එක් වර්ෂයකට මුළු එකතුව රු.1,000 ක් නොඉක්මවන ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද ආධාර මුදලක් සහ අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමැතිය ඇතිව ප්‍රාදේශීය සභාව විසින් ඒ කාර්යයන් සඳහා සම්මත කරනු ලබන වෙනත් ආධාර මුදල් සඳහා ගෙවීම් කළහැකි බව දක්වා ඇතත්, අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව පාපන්දු ක්‍රීඩා තරග සඳහා රු.20,000 ක් සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තියේ විධිවිධාන අනුව පොදු වැදගත්කමකින් යුත් කාර්යයන් පිළිබඳ උත්සව වියදම් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක් දහසක් නොඉක්මවන පරිදි විය යුතු අතර, එය ඉක්මවන විට ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබා ගත යුතු වුවත් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන පළාත් පාලන ක්‍රීඩා උළෙල සඳහා රු.125,460 ක් සභා අරමුදලින් වැයකර තිබුණි.

**(ඇ)** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතට නොගැනෙන කාර්යයක් වූ විදේශ අධ්‍යයන චාරිකාවක් සඳහා විධිමත් අනුමැතියක් ද නොමැතිව සහභාගී වූ ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයාට අනියම් දීමනා හා සංයුක්ත දීමනා ලෙස රු.43,623 ක් 2014 ඔක්තෝබර් 23 දින ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවා තිබුණි.

**(ඈ)** 2013 අයවැය යෝජනා මගින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට කරනු ලැබූ සංශෝධනයන් අනුව 2013 ජනවාරි 01 දිනෙන් හෝ පසුව ආරම්භ වන බදු අය කළහැකි කාලසීමාව (මාසයක් හෝ මාස තුනක්) සඳහා බද්දට යටත් සැපයුම්වල වටිනාකමෙහි එකතුව රුපියල් මිලියන 03 ක් හෝ වර්ෂයකට රුපියල් මිලියන 12 ක් නොඉක්මවන්නේ නම් භාණ්ඩ හෝ සේවා මත බදු ඉන්වොයිස් නිකුත් කිරිම හෝ එකතු කළ අගය මත බදු අය කිරීම නීත්‍යානුකූල නොවන බව දක්වා තිබුණ ද, සභාවේ බද්දට යටත් සැපයුම්වල වටිනාකම කාර්තුවකට රුපියල් මිලියන 03 ක් හෝ වර්ෂයකට රුපියල් මිලියන 12 ක් ඉක්මවා නොතිබිය දී සභාව විසින් 2014 වර්ෂය තුළදී රු.591,907 ක එකතු කළ අගය මත බදු අයකර තිබුණි.

(ඉ) යම් කාර්යයක් සඳහා දෙන ලද අග්‍රිම මුදල් එක් අවස්ථාවකදී රු.20,000 ක සීමාවකට යටත්ව ලබා දියයුතු බව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371(2)(ආ) හි දක්වා ඇතත්, එයට පටහැනිව අවස්ථා 07 ක දී රු.1,075,000 ක් අත්තිකාරම් ලෙස ලබා දී තිබුණි. එමෙන්ම ලබාගත් අත්තිකාරම් නොපියවා තිබිය දී දිගින් දිගටම අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි.

(ඊ) අතුරු අග්‍රිමය එය දෙන ලද කාර්යය නිම වූ විගස පියවිය යුතු බව මු.රෙ.371(2)(ඇ) හි දක්වා ඇතත්, වර්ෂ 05 ඉක්ම වූ රු.33,500 ක් හා වර්ෂ 03 ක් ඉක්ම වූ රු.1,075,000 ක නොපිය වූ අත්තිකාරම් තිබූ බව නිරීක්ෂණය විය.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,111,310 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ වූ පුනරාවර්තන වියදම රු.4,420,314 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 වරිපනම් බදු**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.10,795,713 ක් වූ වරිපනම් බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 බදු කුලී**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.676,534 ක් වූ බදු කුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 බලපත්‍ර ගාස්තු**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.84,622 ක් වූ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.8,772,214 ක උසාවි දඩ හා රු.9,281,450 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.5 දුරකථන විදුලි සංදේශ කුළුණු ගාස්තු

-----------------------------------------

නාගරික සංවර්ධන සහ ප්‍රජා භූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් 2009 අප්‍රේල් 17 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 159/8 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ 4 වන ඡේදය අනුව දුරකථන විදුලි සංදේශ කුළුණක් භාවිතා කිරීමට පෙර අනුකූලතා සහතිකයක් ලබා ගතයුතුය යන්න දක්වා ඇතත්, 2014 මැයි 07 දින සිට කුලීගොඩ ප්‍රදේශයේ භාවිතා කරන සම්ප්‍රේෂණ කුළුණ සඳහා අනුකූලතා සහතිකයක් ලබා ගැනීමකින් තොරව භාවිතයට ගැනීම නිසා ගැසට් නිවේදනයේ 6(vii) වන වගන්තිය අනුව 2014 මැයි 07 සිට 2015 සැප්තැම්බර් 11 දක්වා දින 493 ක් සඳහා රු.24,650 ක දඩ මුදල් අයකර ගත යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

1988 අංක 74 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව 2014 වර්ෂය සඳහා සභාවේ සභාපති, උප සභාපති සහ සභිකයන් 12 දෙනෙකු විසින් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

ස්ථාන මාරු වී ගිය සේවකයින් 03 දෙනෙකුගෙන් හා මිය ගිය සේවකයින් 03 දෙනෙකුගෙන් වර්ෂ 09 ක කාලයක සිට හිඟව පවතින රු.26,760 ක් වූ ණය අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

### 3.3 නිෂ්ක්‍රීය වත්කම්

------------------

2013 ජුනි 05 දිනැති අංක: PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ 2013 සැප්තැම්බර් 05 දින වනවිට අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට දන්වා තිබුණ ද, සභාව සතු ට්‍රැක්ටර් 02 ක් හා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය දිරාපත් වෙමින් පවතින බව 2015 සැප්තැම්බර් 11 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

### 3.4 වත්කම් කළමනාකරණය

---------------------------

සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 11 ක නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සභාව විසින් සිදු කරනු ලැබුව ද, විගණන දිනය වූ 2015 සැප්තැම්බර් 11 වනවිටත් එකී වාහනවල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

### 3.5 හඳුනාගත් අලාභ

------------------

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2014 නොවැම්බර් 23 දින 1" ගැල්වනයිස් බට 544 ක් සභාව වෙත ලබා දී තිබුණි.

(i) සභාව වෙත ලැබී තිබුණු ගැල්වනයිස් බට 544 ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. මෙම බටවලින් බට 168 ක් හික්කඩුව නගර සභාව වෙත 2014 නොවැම්බර් 26 දින භාර දී තිබුණි.

(ii) 2015 අප්‍රේල් 06 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී හික්කඩුව නගර සභාව සතුව බට 105 ක් ද, රජ්ගම ප්‍රාදේශීය සභාව සතුව බට 42 ක් ද, පැවති බව තහවුරු විය.

(iii) මේ අනුව සභාවට ලබා දී තිබූ 1" ගැල්වනයිස් බට 544 න් බට 397 ක ඌනතාවයක් පැවතුණි. ඒ අනුව බට ඌනතාවයේ වටිනාකම රු.439,479 ක් විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය